# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,859 — 1969 ජූනි 20 වැනි සිකුරාදා — 1969.6.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස–අධිකරණ

(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සටහන් වූ පනත් .. .. .. | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් .. .. | 79 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් .. .. .. | — | බුන්වත් නඩු පිළිබඳ දැන්වීම් .. .. .. | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන .. | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් .. .. .. | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් .. | — | නොතාරිස් ලැයිස්තුව .. .. .. | |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් .. .. | — | විවිධ දැන්වීම් .. .. .. | |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම .. .. | — | | |


[සැ. යු.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රිකාවේ V වැනි කොටසේ—කුලී මෝටර් රථ සේවාවක් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම් පත් ලැයිස්තුවක් ද පළවේ.]

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### කුරුණෑගල ඉල්ලීම් නඩුශාලාවේදීය

දෙගල්අස්සේගෙදර පදිංචි සූරිය ආරච්චිල්ලාගේ කිරිබංඩා ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය : 3760/ඇ.බී. එදිරිව

1. දෙගල්අස්සේගෙදර පදිංචි වැපත් අත්ගේ ලේකම්ලාගේ උක්කුබංඩා, 2. දෙගල් අස්සේගෙදර පදිංචි වැපත් අත්ගේ ලේකම්ලාගේ කිරිමැණිකා ........................ විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ 1 වැනි විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ ජූලි මස 16 වැනි බදාදා පෙරවරු 11 ට එක් එක් ඉඩමේදී මුදල් රු. 520 ක් හා එම මුදලට 1966.11.15 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු නීති පොලිය, නඩු ගාස්තු වශයෙන් රු. 71.75 සහ පිස්කල් ගාස්තු අයකරගැනීම පිණිස 1968.5.30 දින දරණ විකිණීමේ නියෝගය ප්‍රකාර විකිණීමට නියමකර ඇති, 1968.3.17 දින දරණ උසාවියේ නඩු තීන්දුවෙන් බැඳී ඇති 1960.2.9 දින ඩී. ඇස්. ඒ. රණවීර නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 4395 දරණ ඔප්පුව පිට පැමිණිලිකරුට උකස්කරනලද දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

#### දේපල විස්තරය

1. කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ අංක ඇ/ජ 298/80 යටතේ ලියාපදිංචිකර ඇති, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ උඩපොල මැදලස්ස කෝරළේ දෙගල් අස්සේ ගෙදර පිහිටි හිරිනාවත්තට මායිම්—උතුරට : උක්කුරාලගේ වත්තේ අගල ; නැගෙනහිරට : අථදස්සී උන්නාන්සේගේ කුඹුර ; දකුණට : ඇල ; බස්නාහිරට : අථදස්සී උන්නාන්සේගේ හේනද යන මායිම් තුල පිහිටි කුරක්කන් සේරු හයක් පමණ වපසරිය ඇති ඉඩමෙන් නොබෙදූ 7/12 පංගුව සහ එහි ඇති උළු සෙවිලිකළ ගෙය හා ඉඩමේ ඇති ගහකොල ආදිය.

2. අංක ඇ/ජ 575/209 යටතේ ලියාපදිංචිකර ඇති ඉහතකී දෙගල් අස්සේගෙදර පිහිටි ගම්ලියද්දේ කුඹුරේ පිල්ලෑවට මායිම් : උතුරට : බෝ ගස ; නැගෙනහිරට : විහාරයට අයිති බක්මීගහ කුඹුරේ පිල්ලෑව ; දකුණට : කළු බංඩාගේ පිල්ලෑව ; බස්නාහිරට : කිරිමුදියන්සේගේ කුඹුර යන මායිම්තුල පිහිටි කුරක්කන් සේරු 4 වපසරිය ඇති ඉඩමෙන් නොබෙදූ (½) දෙකෙන් පංගුව සහ එහි ඇති ගහකොල ආදිය.

ඇම්. අබුබකර්,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1969 ජූනි මස 8 දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

6-860

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවත් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම අගලාවෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| **ජූනි** ... | 69. 6. 6 සිකුරාද ... | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද ... | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද ... | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද ... | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| **ජූලි** ... | 69. 7. 4 සිකුරාද ... | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද ... | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද ... | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද ... | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| **අගෝස්තු** ... | 69. 8. 1 සිකුරාද ... | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද ... | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද ... | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද ... | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද ... | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| **සැප්තැම්බර්** ... | 69. 9. 5 සිකුරාද ... | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද ... | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද ... | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද ... | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| **ඔක්තෝබර්** ... | 69.10. 2 බ්‍රහස්පතින්ද ... | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද ... | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද ... | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| **නොවැම්බර්** ... | 69.11. 7 සිකුරාද ... | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද ... | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද ... | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| **දෙසැම්බර්** ... | 69.12. 5 සිකුරාද ... | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද ... | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි